# හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව
## 2021.07.16

පැමිණීම,

පැමිණීමේ ලේඛණය පරිදි වේ.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ගරු සම සභාපති හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රි වෛද්‍ය උපුල් ගලප්පත්ති මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සහ ගරු මැති ඇමතිතුමන්ලාගේ සහභාගීත්වයෙන් 2021.07.16 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදි.

ප්‍රථමයෙන්ම, ගරු සම සභාපතිතුමන් සහ මැති ඇමතිතුමන්ලා ඇතුළු පැමිණ සිටි සියළුම දේශපාලන නායකත්වය හා රාජ්‍ය නිලධාරීන් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් විසින් පිළිගන්නා ලද අතර, කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ආරක්ෂක පිළිවෙත් අනුගමනය කරමින් පවතින ගැටළු විසඳාගනිමින් දිස්ත්‍රික්කයේ සංවර්ධනය කඩිනම් කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පැවැත්වීමේ වැදගත්කම පෙන්වා දෙමින් සභාවේ කටයුතු කරගෙන යාම සඳහා ගරු සභාපතිතුමන් වෙත අවස්ථාව ලබාදෙන ලදි.

ඒ අනුව 2021.03.01 දිනැති රැස්වීම් වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් එම වාර්තාව සභා සම්මත කරන ලද අතර, අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | **කොවිඩ් - 19 වසංගත තත්ත්වය පිටු දැකීමට අදාල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | |
| 1.1 | කොවිඩ් - 19 වසංගත තත්ත්වය පිටු දැකීමට අදාල වර්තමාන තත්ත්වය ඉදිරිපත් කිරීම | සියළුදෙනාගේ සහයෝගය තුළ මෙම වසංගත තත්ත්වය සාර්ථකව පාලනය කරගැනීමට හැකියාවක් ලැබී ඇති බවත් දිනකට 5 – 25 අතර රෝගීන් හඳුනාගැනීමක් සිදුවන බවත් මේ වන විට ප්‍රතිකාර ලබන රෝගීන් සංඛ්‍යාව 181 ක් හා සුවය ලැබූ පිරිස 2889 ක් හා දිස්ත්‍රික්කය තුළ සිදුවූ මරණ සංඛ්‍යාව 55 ක් ලෙස ට ද,<br>සංචරණ සීමා ලිහිල් කිරීමත් සමඟ රෝග පාලන කටයුතු පිළිබඳ වැඩි සැලකිල්ලක් දැක්විය යුතු බව හා ඒ සඳහා,<br>• අහඹු පරීක්ෂණ සිදුකිරීම ප්‍රාදේශිය කොවිඩ් කමිටු තීරණ අනුව ක්‍රමවත්ව සිදුකිරීමට නියමිත බවත්<br>• ඉදිරියේදී සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ක්‍රියා කලයුතු අතර සියළුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය සමඟ එකතුවී දැනුවත් කිරීම් සිදුකරන බවත්<br>දැනුම් දෙමින් මේ වන විට ලැබී ඇති එන්නත් මාත්‍රා අධි අවධානම් කණ්ඩායම් හඳුනාගනිමින් උපරිම සාධාරණව සාර්ථකව ලබාදී අවසන් වෙමින් පවතින බවට ද වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරන ලදි. | මෙම වසංගත තත්ත්වය සාර්ථක පාලනය කර ගැනීම සඳහා අදාල සියළුම පාර්ශවයන්ගේ සහාය ඉදිරියටත් ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි. | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - හම්බන්තොට |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.2 | කොවිඩ් පරීක්ෂණ සඳහා අවශ්‍ය **PCR** යන්ත්‍රය ස්ථාපිත කිරීමට අවශ්‍ය පරීක්ෂණාගාරය ක් ඉදිකිරීමට ප්‍රතිපාදන සියල්ල ලැබී ඇතැත් මේ වන තෙක් වැඩ ආරම්භ නොවීම සහ හම්බන්කතාට කොවිඩ් රෝහලෙහි වර්තමාන තත්ත්වය | මුළු ප්‍රතිපාදන මුදල රුපියල් මිලියන 25 වන අතර දැනට රුපියල් මිලියන 10 ක ප්‍රමාණයක් ලැබී ඇති බව හා ඉතිරි කොටස ලබා ගැනීමට කැබිනට් අනුමැතිය අවශ්‍ය හෙයින් ඒ සඳහා අමාත්‍යාංශය වෙත අදාල දැනුවත් කිරීම් සිදුකර ඇති බව ප්‍රකාශ කරන ලදි.<br>කොවිඩ් ප්‍රතිකාර රෝහලෙහි රෝගීන් 200 ක් සඳහා පහසුකම් පවතින අතර මේ දිනවල රෝගීන් 98 ක් ප්‍රතිකාර ලබන බව හා ක්‍රමයෙන් රෝගීන් සංඛ්‍යාව අඩුවෙමින් පවතින බවට කරුණු ඉදිරිපත් විය. | පරික්ෂණාගාරයේ වැඩ කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දුනි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ - කොවිඩ් විශේෂ ප්‍රතිකාර ඒකකය. |
| **02** | **සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම** | | | |
| 2.1 | වාරි සෞභාග්‍යා වැඩසටහන | වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන වැව් 49 න් 22 ක වැඩ ආරම්භ කර ඇති අතර ඉන් වැව් 05 ක සංවර්ධන කටයුතු අවසන් අදියරේ පවතින බවත් එසේම, යෝජනාවී ඇති වැව් 14 ක් (තිස්සමහාරාම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙන් කිතලලන්ද වැව, කටගමුව වැව, හම්බන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගෝනවිද්ද වැව, කිකිළි ඉද්ද වැව, ආර බොක්ක වැව, කපුවත්ත වැව, උදාන වැව, ලුණුගම්වෙහෙර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙන් ඔරුකෙංගල වැව, උඩ මත්තල වැව, අම්බලන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙන් හුංගම වැව, වෙලංගහවල වැව, මාමඩල වැව, දෙනිය වැව, සූරියවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙන් ගොඩන්රාලලාගේ වැව) ක්‍රියාත්මක කිරීමට සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය වන බවත් දැනුම් දෙන ලදි.<br>තවද, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වැව් 6 ක ප්‍රතිසංස්කරණ කටයුතු වලින් වැව් 2 ක් අවසන් අදියරේද<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වැව් 12 න් 2 ක වැඩ අවසන් වෙමින් පවතින බවට වාර්තා විය.<br><br>අඟුණකොළපැලැස්ස එරම්ණියාය වැවේ | අදාල ව්‍යාපෘති කඩිනමින් අවසන් කරන ලෙස උපදෙස් ලබාදුන් අතර ඉදිරිපත් කරන ලද වැව් නාම ලේඛනය සඳහා අනුමැතිය ලබා දෙන ලදි.<br><br>මේ සඳහා ජලසම්පාදන | වාරිමාර්ග අධ්‍යක්ෂ,<br><br>පළාත් වාරිමාර්ග ඉංජිනේරු,<br><br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්<br><br>ප්‍රාදේශිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ජලය ජලසම්පාදන මණ්ඩලය මගින් ලබාගන්නා බැවින් එම වැව මහවැලි අධිකාරිය මගින් හෝ ජලසම්පාදන මණ්ඩලය මගින් ප්‍රතිසංස්කරණය සිදු නොකිරීම ගැටළුවක් බවට කරුණු ඉදිරිපත් විය. | මණ්ඩලයෙන් ප්‍රතිපාදන ලබාදීම සුදුසු බවටත් මහවැලි අධිකාරිය මගින් ඇස්තමේන්තු සකස් කිරීම සුදුසු බවටත් දැනුම් දුන් අතර ආයතන දෙක එකතුවී ව්‍යාපෘති කටයුතු කඩිනම් කරන ලෙස තීරණය කරන විය. | කළමණාකරු, ජලසම්පාදන මණ්ඩලය<br><br>නේවාසික ව්‍යාපාර කළමණාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය. |
| 2.2 | දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය | ගොවිජන සේවා මධ්‍යස්ථාන 4 ක වැඩ අවසන් කර ඇති අතර තවත් වැව් 12 ක ඇස්තමේන්තු අත්සන් කර ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇති බවත් තවත් වැව් 09 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ජල විද්‍යා සමීක්ෂණ සිදුකරන බවටත් කරුණු ඉදිරිපත් විය.<br>ව්‍යාපෘති වියදම 4% ක් තරම් ඉතාමත් පහල මට්ටමක පවතින බවත් දකුණු පළාත් සභාවේ ආයතන මගින් එම කටයුතු කඩිනම් කිරීම සඳහා කටයුතු කරන බවත් දන්වන ලදි.<br><br>හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උරණිය වැව මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කිරීමට යොජනාව ඉදිරිපත් කලද මේ වසරේ එය සිදු කිරීමට නොහැකි බවට දන්වන ලදි. | දැනටමත් මූලික අධ්‍යයන කටයුතු ප්‍රමාද වැඩි බව හා එම ප්‍රමාදයන් මඟහරවාගනිමින් සහ මේ වසර 2 ක ඇතුලත පවතින ගැටළු විසඳා ගනිමින් එම කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දුනි.<br><br>උරණිය වැව, පවතින කරුණු හේතුවෙන් ලබන වසරේ පළමු වැඩසටහන ලෙස ක්‍රියාත්මක වීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම්,<br><br>නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ- දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය<br><br>ප්‍රාදේශීය ලේකම් - හම්බන්තොට |
| 2.3 | රන්මිහිතැන්න ඒකාබද්ධ කෘෂි සංවර්ධන ව්‍යාපෘතිය | 2014 වර්ෂයේ ආරම්භ කලද 2015 වර්ෂයෙන් පසු මෙම ව්‍යාපෘති කටයුතු සිදුවී නොමැති බවත් මේ වන විට අදාල ආයතන සමඟ සම්බන්ධ වෙමින් මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට පියවර ගනිමින් සිටින බවට දන්වන ලදි.<br><br>මෙම ව්‍යාපෘතිය තුළ ඉඩම් අක්කර 3504 ක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන බව දැනුම් දෙන ලදි. | එම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා අදාල සියළුම පාර්ශවයන්ගේ සහාය ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි. මීට අදාල ප්‍රතිපාදන දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතියෙන් ලබාගැනීම සුදුසු බවට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම්,<br><br>අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන<br><br>නියෝජ්‍ය අධ්‍යක්ෂ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.4 | විමධ්‍යගත අයවැය වැඩසටහන | මේ වන විට යෝජනා සියල්ලම ලැබී ඇති බවත් ඉන් කිහිපයක් සංශෝදනය වෙමින් පවතින අතර දැනට ප්‍රාදේශිය ලේකම් කාර්යාල මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක වන බවත් ප්‍රතිපාදන කොටසක් මේ වන විට ලැබී ඇති අතර සංශෝධනය වන යෝජනා සඳහා ඉදිරියේදී කඩිනමින් ප්‍රතිපාදන ලබාදීම් සිදුවන බවට කරුණු ඉදිරිපත් කරන ලදි. | අදාල පාර්ශවයන් සම්බන්ධවී කඩිනමින් කාර්යයන් නිම කිරීමට තීරණය විය. | අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන<br><br>සියළුම ප්‍රාදේශිය ලේකම්වරු |
| 2.5 | ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන | ව්‍යාපෘති ගණන 15 ක් හා අනුමත ප්‍රතිපාදන මුදල රුපියල් 18,127,518.12 වන අතර මේ වන විට ව්‍යාපෘති ගණනාවක වැඩ අවසන් වෙමින් පවතින බවට අදාල ප්‍රගතිය ඉදිරිපත් කරන ලදි.<br><br>ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකට එක ක්‍රිඩාපිටියක් සඳහා ලක්ෂ 15 ක ප්‍රතිපාදන අනුමතව තිබුනද සමහර කොට්ඨාශ වල එම මුදලින් ක්‍රිඩාපිටි 2 ක් ඉදිකිරීමට පියවර ගැනීම නිසා අංගසම්පූර්ණව ඉදිකිරීම් කටයුතු සිදු නොවන බවට තොරතුරු වාර්තා විය.<br><br>තෝරාගත් නව ක්‍රිඩාපිටි නාම ලේඛනයක් අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර ඒ සඳහා ප්‍රතිපාදන ලබාදීමට උපරිමය ලක්ෂ 50 කට යටත්ව ඇසතමේන්තු කඩිනමින් සකස් කර ලබා දෙන ලෙස දැනුම් දී ඇති බව දන්වා සිටින ලදි.<br><br>මහජන ක්‍රිඩාපිටියක් ඉදිකිරීමේදී ඕකෙවෙල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට ක්‍රීඩාපිටියක් වෙන්වී නොමැති බවට කරුණු ඉදිරිපත්වූ අතර ඊට හේතුව සුදුසු ඉඩමක් වෙන් කිරීමට නොමැති බවටත් කරුණු ඉදිරිපත් විය. | මෙම ව්‍යාපෘතිවල ඵලදායීතාව ඉහල නංවා ගැනීමට උපදෙස් ලබාදුනි.<br><br>ඉදිකරන ලද වොලිබෝල් ක්‍රිඩාපිටිය අංගසම්පූර්ණව ඉදිකලයුතු බවත් ක්‍රිඩාපිටි 2 ක් වෙනුවට එක් ක්‍රිඩාපිටියක්වත් ඉදිකිරීමට කටයුතු කලයුතු බවට තීරණය විය. අංගසම්පූර්ණව ඉදිකිරීමට ප්‍රමාණවත් නොවන ප්‍රතිපාදන අමාත්‍යාංශය මඟින් ඉල්ලාසිටීමට උපදෙස් ලබාදෙන ලදි.<br><br>නව ක්‍රිඩාපිටි යෝජනා අනුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකින් ක්‍රිඩා පිටි 1 කට ඇස්තමේන්තු සකස් කර කඩිනමින් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි.<br><br>මේ සඳහා සිසුන් ඉතා අඩු සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන කඩිගමුව ශ්‍රී රේවත විද්‍යාලයේ ක්‍රිඩාපිටිය සංවර්ධනය කිරීම සුදුසු බවට තීරණය විය. | සියළුම ප්‍රාදේශිය ලේකම්වරු<br><br>සියළුම ප්‍රාදේශිය ලේකම්වරු, ඕකෙවෙල ,<br><br>ප්‍රාදේශිය ලේකම්, ඕකෙවෙල , කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ , වලස්මුල්ල |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.6 | "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" වැඩසටහන | මෙම වැඩසටහන යටතේ යෝජනා 29 ක් ඉදිරිපත්වී එයින් 27 ක් අනුමතවීමෙන් පසු දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකම ක්‍රියාත්මක වන බවට කරුණු ඉදිරිපත් විය.<br><br>මේ අනුව කම්මල් කර්මාන්තය, බිම්මල් නිෂ්පාදනය, මැටි භාණ්ඩ නිෂ්පාදනය, වැනි නිෂ්පාදන ගම්මාන බිහි කිරීමට කටයුතු කරන බවට කරුණු ඉදිරිපත් විය. | සියළු පාර්ශවයන්ගේ මනා සම්බන්ධීකරණයකින් යුතුව මෙම ව්‍යාපෘතිවල ඵලදායීතාව ඉහල නංවා ගැනීමට උපදෙස් ලබාදුනි. | දිස්ත්‍රික් ලේකම්,<br><br>අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන සියළුම ප්‍රාදේශිය ලේකම්වරු |
| 2.7 | වනඅලි කළමණාකරණ ප්‍රදේශයේ කටයුතු සහ අලිවැට ඉදි කිරිම | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 4 ක කි.මී. 93 ක බිම් සකස් කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්වී ඇත.<br><br>එසේම, ලුණුගම්වෙහෙර අලිවැට සකස්විය යුතු මාර්ගය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරික්ෂණයක් සිදුකලද තවමත් ගැටළු පවතින බවට කරුණු ඉදිරිපත් විය.<br><br>යෝජිත වනඅලි රක්ෂිතයේ වෙනත් ආයතනවලට අදාල ඉඩම්වල වන ප්‍රදේශ පැවතීමනිසා වන අලින්ගේ පැමිණීම නැවැත්වීම අපහසු බවට තොරතුරු ඉදිරිපත් විය. | වනජීවී දෙපාර්තමේන්තුව සහ ගම්වාසීන් අතර එකඟතාවයක් ඇතිකරගෙන සුදුසු පරිදි කඩිනමින් අලිවැට ඉදිකිරීමේ කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි.<br><br>එකී ඉඩම් අයත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ වරාය අධිකාරිය වෙත එම ඉඩම් එළිකිරීම සඳහා දැනුම් දීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම්<br><br>අතිරේක දිස්ත්‍රික් ලේකම්<br><br>අදාල ප්‍රාදේශිය ලේකම්වරු<br><br>වනජීවී සහකාර අධ්‍යක්ෂ |
| 2.8 | තෘණ භූමි සංවර්ධනය | දිස්ත්‍රික්කයේ තෘණ භූමි 05 ක් යෝජනාවී ඇති අතර මහවැලි බල ප්‍රදේශයේ පිහිටි කඩවර තෘණ භූමියේ ගැටළුවක් නොමැති බවත් අනෙකුත් 04 ම වන සංරක්ෂණ ප්‍රදේශ වල පිහිටා ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම අවශ්‍යා බව පෙන්වා දෙන ලදි. | දිස්ත්‍රික්කයේ ගව පාලනය සම්බන්ධයෙන් ගැටළු බොහෝමයක් ඇතිවී තිබෙන හෙයින් දිස්ත්‍රික්කයේ තෘණ භූමි සංවර්ධනය කලයුතු බවට තීරණය විය. | නේවාසික ව්‍යාපාර කළමණාකරු - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, නියෝජ්‍ය අධ්‍යක්ෂ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම්, තිස්සමහරාමය/ ලුණුගම්වෙහෙර |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.9 | "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම | මේ වන විට දිස්ත්‍රික්කයට අදාල ගංගා 19 මුල් කර ගනිමින් සියළු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වලට අදාලව ප්‍රාදේශිය කමිටු පිහිටුවා අවසන් බවත් ඒ අනුව ව්‍යාපෘති වාර්තා කැඳවමින් පවතින අතර වලවේ ගඟ හා ඌරු බොකු ඔය අනුමැතියට යොමු කර ඇතැත් මේ දක්වා අනුමැතිය ලැබී නොමැති අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඇස්තමේන්තු සැකසීම සිදුවන බව හා එම ක්‍රියාවලිය කඩිනම් කිරීමෙන් ව්‍යාපෘති ජාතික කමිටුව වෙත ඉදිරිපත් කිරීමට හැකියාවක් පවතින බව ප්‍රකාශ කරන ලදි. | ප්‍රමාදයකින් තොරව ඇස්තමේන්තු සකස් කර ව්‍යාපෘතිය කඩිනම් කරන ලෙස ප්‍රකාශ කරන ලදි. | මධ්‍යම පරිසර අධිකාරිය,<br><br>වාරිමාර්ග අධ්‍යක්ෂ |
| 2.10 | කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන | ගොවිජන සේවා මධ්‍යස්ථාන වල නිෂ්පාදකයින් ලියාපදිංචිය සිදුවීම, කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් පුහුණුකර අවසන් වීම, නව නිෂ්පාදකයින් පුහුණු කිරීමට පියවර ගැනීම මේ වන විට සිදුකර ඇති අතර අමුද්‍රව්‍ය කැබලි කිරීමේ නව යන්ත්‍ර ගොවීන් විසින් අඩු පිරිවැයකින් නිපදවා හඳුන්වාදීම සිදුකිරීම තුළ හොඳ ප්‍රවනතාවයක් බවට පෙන්වා දෙන ලදි. | රසායනික පොහොර නැවැත්වීමේ තීරණය ඒ අයුරින්ම ක්‍රියාත්මක වන බැවින් හිඟයකින් තොරව කාබනික පොහොර ලබාදීමේ කටයුතු කලයුතු බවට දන්වන ලදි.<br><br>දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මට්ටමින් කමිටු පිහිටුවා මෙම වැඩපිළිවෙල ශක්තිමත් කරන ලෙස දන්වන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>ප්‍රාදේශීය සභා ගරු සභාපති වරුන්,<br><br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරු<br><br>කෘෂිකර්ම අධ්‍යක්ෂ/ නි.අධ්‍යක්ෂව රු<br><br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්<br><br>සහකාර අධ්‍යක්ෂ (පොහොර) |
| 03 | **සමෘද්ධි සිප්දොර ශිෂ්‍යත්ව ප්‍රදානය** | | | |
| ▪ | අ.පො.ස (සා.පෙ.) සමත් අ.පො.ස (උ.පෙ.) අධ්‍යාපන හදාරණ සිසු සිසුවියන් 2169 ක් සඳහා මසකට රුපියල් 1500.00 ක දීමනාවක් වර්ෂ 02 ක් පුරා ලබාදීමේ ආරම්භක පියවර ලෙස සිසු සිසුවියන් 10 දෙනෙක් සඳහා ශිෂත්ව ප්‍රධානය සංකේතාත්මකව සිදුකරන ලද අතර මෙම වැඩසටහන සඳහා රුපියල් මිලියන 78.2 ක් වෙන්වී ඇති බවත් දන්වන ලදි. | | | |
| 04 | **පසුගිය රැස්වීමේදී ගනු ලැබූ තීරණවල ප්‍රගතිය සාකච්ඡා කිරීම** | | | |
| 4.1 | කුඹුරු හා ගොඩ ඉඩම්වල වැලි කැපීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | පසුගිය රැස්වීමේදී වලවල් වැසීම හා ඇප තැන්පත් ලබාදීම් පිළිබඳ විස්තර වාර්තාවක් ලබා දෙන ලෙස දැන්වුවද මේ දක්වා ඒවා ලබා නොදීම සම්බන්ධව සාකච්ඡා විය. | මාසයක් ඇතුලත සියළුම බලපත්‍රලාභීන්ගේ ලේඛනය, තැන්පතු මුදල් ප්‍රමාණයන්, වැලි කැපීමෙන් පසු වලවල් | වාරිමාර්ග අධ්‍යක්ෂ,<br><br>කැණීම් ඉංජිනේරු-භූ |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | වැසීමේ ප්‍රගතියද ලබා දෙන ලෙස දන්වන ලදි. | විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය) |
| | | වැලි ප්‍රවාහනයේදී ප්‍රාදේශීය සභා මාර්ගවලට විශාල වශයෙන් හානි සිදුවන අතර එය අවම කර ගැනීමට ගාස්තුවක් අයකර ගතයුතු බවට කරුණු ඉදිරිපත් විය. | මේ සඳහා පළාත් පාලන පනතේ බලතල අනුව මාර්ග හානි අවම කිරීමට අයකලයුතු ගාස්තු ඇතුලත් වාර්තාවක් ලබා දෙන ලෙස දන්වන ලදි. | සියළුම ප්‍රාදේශීය සභා ගරු සභාපතිවරු. |
| 4.2 | රොඩීමැල්ල බස්නාව අවහිර වීම හේතුවෙන් මතු වී ඇති ගැටළු | බස්නාවේ ජලය බැසයාමේදී ඇල මාර්ගයේ පහළ කෙලවරේ වැවේ ගහට ආසන්න කොටසේ පවතින අවහිරතාව මෙන්ම අනවසර ඉදිකිරීම් ද බලපාන බවට කරුණු ඉදිරිපත් විය. | සියළු පාර්ශවයන් එක්වී ඒකාබද්ධ පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසත් අනවසර ඉදිකිරීම් නතර කරන ලෙස හා ඇලේ පහල කෙලවරේ අවශ්‍ය ස්ථානයට අමුණක් ඉදිකිරීමට ඇස්තමේන්තුවක් සකස් කර ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදි. | ප්‍රාදේශීය ලේකම්- හම්බන්තොට, අම්බලන්තොට<br><br>අධ්‍යක්ෂ - වාරිමාර්ග |
| 4.3 | බෙලිඅත්ත වාඩිය අක්කර 20ක පොල් ඉඩමේ වැලි කැපීම් | ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගවල නියමිත බර ඉක්මවූ ටිපර් රථ මඟින් වැලි කපා ප්‍රවාහනය කරන බවත් ඒ සඳහා නීතිය ක්‍රියාත්මක නොවන බවටත් කරුණු ඉදිරිපත් විය. ඒ සඳහා කියුබ් 100 ක වෙළඳ බලපත්‍රයක් ලබාදී ඇති බවටත් කරුණු අනාවරණය විය. | බලපත්‍ර නිකුත් කිරීමේදී ප්‍රාදේශීය සභාවද දැනුවත් කලයුතු බවත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ තීරණය පරිදි ඒකාබද්ධ පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස තීරණය විය. | ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී,<br><br>ප්‍රාදේශීය ලේකම්- බෙලිඅත්ත,<br><br>කැණීම් ඉංජිනේරු-භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය |
| 4.4 | කටුවන ෆයිනස් වගාව ඉවත් කිරීම | වගා කිරීමට අපේක්ෂිත භූමි ප්‍රමාණය, වගා කිරීමට අපේක්ෂිත පලතුරු වර්ග සම්බන්ධව වාර්තා කරන ලෙස පරිසර අමාත්‍යාංශයෙන් කල විමසීම වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>පියවරෙන් පියවර ෆයිනස් ගස් ඉවත් කර 2025 වසරේදී සම්පූර්ණයෙන් ම ඉවත් කිරීමට කටයුතු කරන බව ද දැන්වීය. | ෆයිනස් වගාව ඉවත් කිරීමේ සැලැස්ම ඉදිරිපත් කරන ලෙස දන්වන ලදි. | දිසා වන නිලධාරි |
| 4.5 | පොලොම්මාරුව අඳ බිහිරි පාසල වසා දැමීම | පාලක මණ්ඩලයේ බලය අහෝසිකර මෙය දිස්ත්‍රික් ලේකම් වෙත බලය පැවරීමෙන් පසු උසාවි නියෝගයක් මත පාලන අධිකාරිය නැවත කටයුතු කරන අතර නඩුවක් ගොණුකර ඇත. | අකටයුතු රාශියක් සිදුවන බවත් එහි ඇති ගැටළු විසඳිය යුතු බවට තීරණය වූ අතර උසාවි තීරණය අනුව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | පාලන අධිකාරියේ අයහපත් ක්‍රියාමාර්ග හේතුවෙන් දැඩි ගැටළුකාරී තත්ත්වයක් මෙම ආයතනය තුළ ඇතිවී තිබෙන බවට කරුණු ඉදිරිපත් විය. | තීරණය විය. | |
| 4.6 | බඳගිරිය ග්‍රාම නිලධාරී වසමේ භාවිතයට නොගන්නා ජල ටැංකිය යොදා ගනිමින් උස්සාන වාරි ව්‍යාපෘතියක් ආරම්භ කිරීම | ජලසම්පාදන මණ්ඩලය මඟින් ප්‍රජා ජල ව්‍යාපෘතිය පවරාගෙන ඇති බැවින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල හැකි බවත් මේ සඳහා බඳගිරිය වැවෙන් නිසි අවසරය ලබාගත යුතු බවටත් කරුණු ඉදිරිපත් වූ අතර වැවෙන් ජලය ලබාගැනීම සම්බන්ධව ව්‍යාපාර කමිටුවේදී සාකච්ඡා කර අවශ්‍ය ප්‍රමාණය සම්බන්ධ එකඟතාවයක් ලබාගත යුතු බවට තීරණය විය. | ඒ අනුව අදාල කටයුතු කඩිනම් කරන ලෙස දැනුම් දුනි. | ප්‍රාදේශීය ලේකම්-හම්බන්තොට,<br>ස්ථාන භාර නිලධාරි - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව |
| 4.7 | රක්ෂිත ඉඩම්වලට ව්‍යාජ පිඹුරු පත් හා නොතාරිස් ඔප්පු සකස් කර ඉඩම් ජාවාරම් සිදු කිරීම | මේ සම්බන්ධයෙන් විමර්ෂණ කටයුතු සිදුකරමින් පවතින අතර අවශ්‍ය සාක්ෂි සපයා ගැනීමේදී පවතින සිතියම් හා වාර්තා ප්‍රමාණවත් නොවීම තුළ ගැටළු මතුවී ඇති බව ප්‍රකාශ කරන ලදි. | අදාල නිවැරැදි තොරතුරු ලබාගෙන විමර්ශන කටයුතු කඩිනම් කර වාර්තාවක් ලබාදෙන ලෙස උපදෙස් ලබා දුනි. | ප්‍රාදේශීය ලේකම්-හම්බන්තොට,<br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි-තංගල්ල,<br>ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි |
| 4.8 | වලවේ ගඟ රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන් හේතුවෙන් මතු වී ඇති ගැටළු | පදිංචිකරුවන් 473 ක් පමණ සිටින බවත් ඔවුන්ගේ සංස්කෘතික හා ජීවන තත්ත්වයන් අනුව ඈත ප්‍රදේශයක පදිංචි කරවීමට අපහසුවී ඇති බවට කරුණු වාර්තා විය. තවද, ඔවුන් ඉවත් කරන්නේ නම් නිසි පරිදි ඉඩම් ලබාදිය යුතු බවටත් කරුණු ඉදිරිපත් විය. | වලවේ ගඟ අපවිත්‍ර වීම වලක්වා ගැනීමට මහල් නිවාස ව්‍යාපෘතියක් මඟින් හෝ මෙම ගැටළුව විසඳීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම්-අම්බලන්තොට |
| 4.9 | තංගල්ල විවිධසේවා සමුපකාර සමිතියේ මතුවී ඇති ගැටළු | මේ සම්බන්ධව අදාල ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව එම කටයුතු සාමාන්‍ය පරිදි සිදුවන බව දැනුම් දෙන ලදි. | මේ සම්බන්ධයෙන් පසුවිපරමකින් යුතුව අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබාදුනි. | සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් |
| 4.10 | වලස්මුල්ල තොග පොලට අයත් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම | ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අදාල කටයුතු ආරම්භ කල බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබාදුනි. | අණදෙන නිලධාරී - ශ්‍රී ලංකා යුධ හමුදාව, 10(සේව)ගැමුණු හේවා බලඇණිය,<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ - නාගරික සංවර්ධන |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **5.** | **වාරිමාර්ග ක්ෂේත්‍රයේ ගැටළු** | | | |
| 5.1 | හම්බන්තොට කොහොලංකල කැලිගම වැව සිට මැටිගත්ත වැව දක්වා යෝජිත ඇල මාර්ගය සංවර්ධනය කිරීමට අනුමැතිය ලබා ගැනීම | මැටිගත්ත වැව ගොවි සංවිධානය යටතේ අක්කර 75ක පමණ කුඹුරු වගා කරන බවත් වැවට ස්ථිර ජල මාර්ගයක් නොමැති බැවින් එයට විසඳුමක් ලෙස මෙම ඇළ මාර්ගය හරහා කැලිගම වැවෙන් ජලය ලබා ගැනීමට යෝජිත අතර ඒ සඳහා මෙම වැව් 02 අයත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා ඇල මාර්ගය වන අලි කළමණාකරණ රක්ෂිතය හරහා වැටී ඇති බැවින් ඊට අදාල අනුමැතීන් අවශ්‍ය වන බවටත් කරුණු ඉදිරිපත් විය. | අදාල සියළු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්,<br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්<br>වන ජීවී සහකාර අධ්‍යක්ෂ |
| 5.2 | ලුණුගම්වෙහෙර ව්‍යාපාරය ආශ්‍රිත වාරි ඇල ප්‍රතිසංස්කරණය කර නොමැතිවීම හේතුවෙන් ජලය අපතේ යන බැවින් එම ඇළවේලි ප්‍රතිසංස්කරණය කරන ලෙස ඉල්ලීම | විවිධ ව්‍යාපෘතීන් හරහා වාර්ෂිකව වාරි පද්ධතීන් ප්‍රතිසංස්කරණය කිරීම යථා පරිදි සිදුවන බව දැනුම් දෙන ලදී.<br>ඇල මාර්ග නිරන්තර බාදනයට ලක්වන බැවින් අවහිර වන නිසා වසරක් පාසා මේවා ප්‍රතිසංස්කරණය කිරීමට සිදුවන බවට කරුණු ඉදිරිපත් විය. | වාර්ෂිකව වාරි පද්ධතීන් නඩත්තු කිරීම සිදු විය යුතු බව දැනුම් දෙන ලදී. | වාරිමාර්ග අධ්‍යක්ෂ<br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්<br>පළාත් වාරිමාර්ග ඉංජිනේරු |
| **6.** | **නාගරික සංවර්ධන ක්ෂේත්‍රය** | | | |
| 6.1 | ලුණුගම්වෙහෙර කොට්ඨාසයේ සේනපුර ග්‍රාම නිලධාරී වසමේ වල් බිහි වී ඇති කඩ කාමර 06 ප්‍රාදේශීය සභාවට පවරා දෙන ලෙස ඉල්ලීම | ජනපදකරණයත් සමග මෙම ගොඩනැගිලි ඉදි කර ඇති අතර සමූපකාර පවත්වා ගෙන යාම සඳහා එම ගොඩනැගිලි භාවිතා කර ඇති බවත් සමූපකාර ව්‍යාපාරය අභාවයට යාමත් සමග එම ගොඩනැගිලි අභාවයට ගොස් ඇති බැවින් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් පවරා දීම් සඳහා අනුමැතිය ඉල්ලා ඇති බව දැනුම් දෙන ලදී. තවද ඉඩම් අයිතිය ප්‍රාදේශීය ලේකම් සතුවන බවත් ගොඩනැගිලි ඉදිකිරීම ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් සිදු කරඇති බවත් සමූපකාර දෙපාර්තමේන්තුවට මෙම ගොඩනැගිලි නියමාකාරයෙන් පැවරීම සිදු වී නොමැති බවටත් කරුණු ඉදිරිපත් විය. තිස්සමහාරාමය ඇල්ලගලද මෙම ගැටළුව පවතින බවට කරුණු වාර්තා විය. | දැනට ඉඩම් අයිතිය ප්‍රාදේශීය ලේකම් සතුවන බැවින් අදාල පැවරීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දැනුම් දෙන ලදී. | ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම්<br>තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්<br>සහකාර සමූපකාර කොමසාරිස් |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 6.2 | අඟුණකොළපැලැස්ස හා සූරියවැව නගරවල යෝජිත සංවර්ධන කටයුතු සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම | 2021 වර්ෂයේ මහවැලි වලව කලාපය සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන යටතේ අඟුණකොළපැලැස්ස පොළ භූමිය සංවර්ධනය කිරීම, බස් නැවතුම්පල සංවර්ධනය කිරීම, වැව ප්‍රතිසංස්කරණය කිරීම සහ එහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම,නගරයේ අපවහන පද්ධතිය විධිමත් කිරීම යන ව්‍යාපෘති සහ සූරියවැව කොට්ඨාසයේ ආර්ථික මධ්‍යස්ථානයක් ඉදි කිරීම, බස්නැවතුම්පල අසල නගරයේ මහජන වැසිකිලි පද්ධතියක් ඉදි කිරීම, නගරයේ වැසි ජලය බැස යාම සඳහා බැද්දේවැව අතුඇල හරහා කාණු පද්ධතිය පුළුල් කිරීම, කංකානම්ගම වැව ප්‍රතිසංස්කරනය කිරීම, HT-34වැව ප්‍රතිසංස්කරණය යන ව්‍යාපෘතීත් මීට අමතරව වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත වරායයාය වැව,බෝපැලැස්ස වැව, හීංආර වැව, මහජඳුර වැව,වෙලංගහවෙල වැව, මහ වැව, එරම්ණියාය වැව, ගල් වැව ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | කඩිනම් අවශ්‍යතාවය සඳහා මේ වන විටත් ආවරණ අනුමැතිය ලබා දී ඇති අතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදී. | ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය |
| **7.** | **ඉඩම් ක්ෂේත්‍රය** | | | |
| 7.1 | වීරවිල පශු සම්පත් සංවර්ධන මණ්ඩල(NLDB) ගොවිපලෙන් ගුවන් හමුදාව වෙත කෘෂිකාර්මික කටයුතු සඳහා අක්කර 50ක භූමියක් ලබා ගැනීම | රටේ ආර්ථික සංවර්ධනය සඳහා සෘජු දායකත්වයක් සැපයීමේ අරමුණින් ගුවන් හමුදා කඳවුරු ආශ්‍රිතව කෘෂිකාර්මික ව්‍යාපෘති ඇති කිරීමේ වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ද එවැනි ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා වීරවිල NLDB ගොවිපලෙන් අක්කර 50ක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී.<br>ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ද මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දැනුම් දී ඇති බව ද දැනුම් දෙන ලදී.<br>පසුගිය වසරේ සිට NLDB භූමියේ පොල් වගාව ආරම්භ කර ඇති බවත් එම භූමියෙන් ඉඩම් නිදහස් කර ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය අවශ්‍ය බවටත් කරුණු ඉදිරිපත් විය.<br>මෙම භූමියේ පොල් වගා කළ කොටස හැර තව දුරටත් ඉතිරි ඉඩම් ප්‍රමාණයක් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳව තව දුරටත් සොයා බලා ඉඩමක් ලබා දීමට උපදෙස් දෙන ලදී. | තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම්<br>අණදෙන නිලධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br>කළමණාකරු, වීරවිල පශු සම්පත් සංවර්ධන මණ්ඩල (NLDB) ගොවිපල |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 7.2 | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රිස්තියානි ආගමික කටයුතු වෙනුවෙන් වෙන් කරන ලද ඉඩම සම්බන්ධව පැන නැගී ඇති ගැටළුව | 2009 වර්ෂයේ දී නගර සංවර්ධන කටයුතු සිදු කරන අවස්ථාවේ දී කතෝලික දේවස්ථාන සඳහා අක්කර 5ක භූමියක් වෙන්කර ඇති බවත් එම භූමිය සඳහා විවිධ නිකායන් විසින් ඉඩම් කොටස් ඉල්ලීම නිසා ගැටළුකාරී තත්ත්වයක් උද්ගතව පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. | සියළු පාර්ශවයන් කැඳවා මේ සම්බන්ධයෙන් වෙනම සාකච්ඡාවක් පවත්වා තීරණයක් ගැනීම සුදුසු බව දැනුම් දෙන ලදී. | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්<br>දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය |
| 7.3 | තිස්සමහාරාම සහකාර පොලිස් අධිකාරි කාර්යාලය පවත්වා ගෙන යනු ලබන ඉඩම සම්බන්ධ ගැටළුව | ප්‍රාදේශීය සභාවට අයත් දේපලක් බවත් තාවකාලිකව පොලිස් විශේෂ කාර්ය බලකායට ලබා දී ඇති බවත් දැනට පොලිසිය සඳහා වෙන්කරන ලද ඉඩමක් පවතින බැවින් මෙම ඉඩම නැවත සභාවට ලබා දෙන ලෙසත් ඉල්ලීම් ඉදිරිපත් විය.<br>එහෙත් වසර 08ක පමණ කාලයක සිට මෙම ස්ථානයේ පොලිස් අධිකාරී කාර්යාලය පවත්වා ගෙන යන බවටත් තොරතුරු ඉදිරිපත් විය. | මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කර ඉදිරි තීරණයක් ගැනීම සුදුසු බවට තීරණය විය. | තිස්සමහාරාම ප්‍රාදේශීය සභා සභාපති<br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී |
| 7.4 | ලුණුගම්වෙහෙර කොට්ඨාසයේ අවශේෂ කැලෑ ඉඩම් ප්‍රාදේශීය ලේකම් වෙත ලබා ගැනීම | මූලික ඉඩම් හඳුනා ගැනීමේ කටයුතු වලදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විරෝධයක් නොදක්වන ලද නමුත් ඉඩම් පවරා ගැනීමේ දී ගැටළු මතුවන බවට කරුණු ඉදිරිපත් විය.<br>ඉඩම් පැවරීමේ දී කැළෑවක් වශයෙන් භාවිතා කළ නොහැකි නම් පමණක් එම ඉඩම් පැවරීමට කටයුතු කළ යුතු බවට උපදෙස් ලැබී ඇති බවට ද කරුණු ඉදිරිපත් විය.<br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් කල සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයේ රන්මුදුවැව, කපුකිනිස්සවැව, මහගල්වැව වැනි ප්‍රදේශ ලඳු කැළෑ ලෙස පවතින අතර ඇතැම් ප්‍රදේශවල දැනටමත් හේන් වගාව සිදු කරන බවද දැනුම් දෙන ලදී. | ඉඩම් පවරා දීමට අනුමැතිය දිය නොහැකි හේතුව ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. තවද පාරම්පරිකව හේන් ගොවීන් සඳහා එම අවස්ථාව ලබා දෙන ලෙස වැඩිදුරටත් දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්, ලුණුගම්වෙහෙ ර<br>ප්‍රාදේශීය ලේකම්,සූරිය වැව<br>දිසා වන නිලධාරී |
| 7.5 | අම්බලන්තොට හාතාගල ප්‍රදේශයෙන් සාගර විශ්ව විද්‍යාලය සඳහා අක්කර 45ක භූමියක් ඉල්ලීම | 2010 වර්ෂයේ සිට මේ සඳහා භූමිය වෙන් කර ඇති නමුත් විශ්ව විද්‍යාලය ඉදිවන ස්ථානය පිළිබඳව නිශ්චිත තීරණයක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | මෙම භූමියෙහි සාගර විශ්ව විද්‍යාලය ඉදි කිරීම සුදුසු බවට තීරණය වූ අතර එය කඩිනම් කරන ලෙස අදාල අමාත්‍යාංශය වෙත දන්වා යැවීමට ද තීරණය විය. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 7.6 | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලියන්ගස්තොට | 1986 වර්ෂයේ සිට මෙම භූමි කොටස කැබිනට් පත්‍රිකාවක් මගින් පශු සම්පත් මණ්ඩලය වෙත පවරා ඇතත් සංවර්ධන කටයුතු කිසිවක් සිදු නොවන බවට | මෙම ඉඩම් කොටස ලබා දීම සුදුසු බව තීරණය වූ අතර අදාල ක්‍රමවේද අනුගමනය කරමින් ඉදිරි | දිස්ත්‍රික් ලේකම්<br>කළමණාකරු, |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | ග්‍රාම නිලධාරී වසමේ අභඹඩවිල ගම්මානයේ පොදු කටයුතු පවත්වාගෙන යාම සඳහා පශු සම්පත් මණ්ඩලය විසින් අත්හැර දමා ඇති ඉඩම් කොටසක් ලබා ගැනීම | කරුණු වාර්තා විය.<br>ගව පාලනය විශාල වශයෙන් ගොවිපල තුළ සිදු කරන බවත් මෙම ඉඩම ඒ සඳහා භාවිතා කරන බවටත් තොරතුරු ඉදිරිපත් කල අතර ඉඩම් කොටසක් ලබා දිමට ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය අවශ්‍ය බවට ද කරුණු ඉදිරිපත් කරන ලදී. | කටයුතු සිදු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | පශු සම්පත් මණ්ඩලය |
| 7.7 | ඕලුවැව, ඩෝසර්වත්ත බලපත්‍රලාභී කුඹුරු ඉඩම්ලාභීන්ට වගා කටයුතු සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු වේ අවසරය හා අනුමැතිය ඉල්ලීම | මෙම වැව යටතේ 1986 වර්ෂය දක්වා වගා කටයුතු සිදු කර පසුව අත්හැර දමන ලද මෙම ඉඩම් නැවත සංවර්ධනය කිරීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් විය. දැනටමත් වගා කරන කුඹුරු ලෙස පවතින කොටස පමණක් නිදහස් කළ හැකි බවත් කැළයක් ලෙස පවතින ප්‍රදේශය නිදහස් කළ නොහැකි බවත් වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා බාධාවක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. | නිදහස් කළ හැකි ප්‍රදේශය නිදහස් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්, හම්බන්තොට<br>දිසා වන නිලධාරි |
| 7.8 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ යෝජිත නව පොලිස් ස්ථාන හා මුරකුටි සඳහා ස්ථාන ලබා ගැනීම සහ අවශ්‍ය යටිතල පහසුකම් ලබා ගැනීම | දිස්ත්‍රික්කය සඳහා පොලිස් ස්ථාන හා මුරකුටි 9ක් ඉදි කිරීමට යෝජිත බව දැනුම් දෙන ලදී.<br>අදාල ඉඩම් හඳුනා ගැනීමේ කටයුතු මේවන විට බොහෝ දුරට අවසන් වී ඇති නමුත් සූරියවැව මීගහජඳුර ප්‍රදේශයේ මේ සඳහා සුදුසු බිම් කොටසක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය.<br>ආයුර්වේද රෝහල පිහිටි භූමියේ යම් ඉඩම් කොටසක් හඳුනාගෙන ඇති බවත් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත් දැනුම් දෙන ලදී.<br>මත්තල පොලිස් ස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති නමුත් අදාල ඉඩම පැවරීම සිදු කර නොමැති බවට කරුණු ඉදිරිපත් විය.<br>අදාල ඉඩම් ප්‍රමාණය මේ සඳහා වෙන් කිරීම ගැටළුවක් නොවන බව දැනුම් දෙන ලදී.<br>එසේම මාමඩල ප්‍රදේශයේ පොලිස් ස්ථානයක අවශ්‍යතාවය පවතින බවට ඉල්ලීම් ඉදිරිපත් විය. | අදාල ඉඩම් හඳුනා ගැනීමේ,පවරා ගැනීමේ කටයුතු කඩිනම් කරමින් ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී.<br>මාමඩල ප්‍රදේශයේ පොලිස් ස්ථානයක අවශ්‍යතාවය සොයා බැලීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම්වරුන්<br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි-තංගල්ල<br>දිසා වන නිලධාරි |
| 7.9 | අම්බලන්තොට වී අලෙවි මණ්ඩල නිවාසයන්හි පදිංචිකරුවන් සඳහා ඉඩම්වල | දැනට පවුල් 08ක් වාසය කරන බවත් නාගරික සංවර්ධන අධිකාරිය අවසන් නගර සැලසුම ඉදිරිපත් කරන තෙක් විසඳුමක් ලබා දීම කළ නොහැකි බවටත් කරුණු ඉදිරිපත් විය. | ස්ථානීය පරීක්ෂණයක් සිදුකර අදාල නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් ඊලඟ සම්බන්ධීකරණ රැස්වීමට ඉදිරිපත් කරන | ප්‍රාදේශීය ලේකම්-අම්බලන්තොට<br>නියෝජ්‍ය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | අයිතිය තහවුරු කිරිම | පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක දීද මේ පිළිබඳව සාකච්ඡා කළ බවත් උහපිටගොඩ ප්‍රදේශයෙන් පර්චස් 40ක් ලබා දීමට යෝජනා කළ බවත් දැනුම් දෙන ලදී. | ලෙස දැනුම් දෙන ලදී. නිශ්චිත විසඳුමක් ඊලඟ සම්බන්ධීකරණ රැස්වීමට ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඉඩම් කොටස් බෙදා දීම සුදුසු බවද දන්වන ලදී. | අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය |
| **8.** | **ජලසම්පාදන ක්ෂේත්‍රය** | | | |
| 8.1 | අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉදිගැටවෙල ග්‍රාම නිලධාරී වසමට වකමුල්ල ජල යෝජනා ක්‍රමය මගින් නව ජල සම්බන්ධතා ලබා නොදීම | මෙම ප්‍රදේශයට අදාලව වකමුල්ල ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බවද එය අවසන් වන තුරු ජල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට නොහැකි බවද දන්වන ලදී. | ජල යෝජනා ක්‍රමය කඩිනම් කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | ප්‍රාදේශීය කළමණාකරු, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |
| 8.2 | පෝෂිත ඇල හරහා මච්සිරිගම/දිමුතුගම ගම්මානයන් දක්වා ජලය ලබා ගැනීම | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී මෙම කාරණය ඉදිරිපත් වූ අතර ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත යොමු කර ඇති බව දැනුම් දෙන ලදී.<br>වාර්ෂික සංවර්ධන සැලසුමට අතුළත් කර ඇති බවත් ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත බවත් දන්වන ලදී. | වාර්ෂික සැලැස්ම කඩිනමින් ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | ප්‍රාදේශීය කළමණාකරු, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>ප්‍රාදේශීය ලේකම්, හම්බන්තොට |
| 8.3 | සූරියවැව ප්‍රාදේශීය සභාව මගින් පානීය ජලය නොමැති ප්‍රදේශයන් වෙත බෙදාහැරීම සඳහා ජලසම්පාදන මණ්ඩලය මගින් ලබා දෙන ජලය නොමිලයේ ලබා ගැනීම | නියඟය වැනි ආපදා අවස්ථාවක දී එලෙස ලබා දීමට හැකියාව පවතින බවත් සාමාන්‍ය තත්ත්වයක් තුළ නොමිලයේ සැපයීමට හැකියාවක් නොමැති බවත් දැනුම් දෙන ලදී. ජලසම්පාදන මණ්ඩලයට පානීය ජලය ලබා දිය නොහැකි ප්‍රදේශවලට බව්සර් ආධාරයෙන් ප්‍රාදේශීය සභා විසින් ජලය බෙදා හරිනු ලැබුවද ප්‍රාදේශීය සභා සතු සීමිත අරමුදල් මේ සඳහා ප්‍රමාණවත් නොවන බවද දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික්කය සඳහා මේ වෙනුවෙන් වෙන් කරන වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණය වැඩි කර දෙන ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කිරීමට තීරණය විය. | ප්‍රාදේශීය කළමණාකරු, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 9. | මාර්ග ක්ෂේත්‍රය | | | |
| 9.1 | මහජන ආරක්ෂාවට තර්ජනයක් වන ස්ථාන පිළිබඳව දැනුවත් කිරීම | මාර්ග දෙපස කාණු පද්ධතීන් නිසි පරිදි ආවරණය කර නොතිබීම,ඇතැම් මාර්ගවල සිදු කරන ඉදිකිරීම්, ජලනල එලීම, බෝක්කු ඉදිකිරීම් ආදී කටයුතු වලදී මහජන ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් නොවීම හේතුවෙන් සිදුවන අනතුරු වළක්වා ගැනීම සම්බන්ධ වගකීම් අදාල විෂය නිලධාරීන් වෙත පැවරිය යුතු බවට දන්වා ඇත. | අදාල සියළු ආයතන මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කල යුතු බවට දන්වන ලදී. | ප්‍රධාන ඉංජිනේරු,මාර්ග සංවර්ධන අධිකාරිය, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br>ප්‍රාදේශීය කළමණාකරු, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය |
| 9.2 | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්ත කර ඇති බහුකාර්ය සංවර්ධන සාධක බලකායේ ශ්‍රමලාභීන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේම රාජ්‍ය ආයතනවලට අන්තර්ග්‍රහනය කිරීම | අදාල රැකියාලාභීන් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළම පිහිටි රාජ්‍ය ආයතනවල සේවය කිරිම සඳහා යොමු කළ යුතු බවට කරුණු ඉදිරිපත් විය. රැකියාලාභීන් රැකියා ස්ථාන සඳහා යොමු කිරීම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මගින් සිදු කළ යුතු බවට සාකච්ඡා විය. | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මගින් සේවා ස්ථාන සඳහා රැකියාලාභීන් නම්කිරීමටත් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ඇතිව එම පිරිස රැකියා ස්ථාන සඳහා අනුයුක්ත කිරීම සිදු කල යුතු බවට තීරණය විය. | සියළුම ප්‍රාදේශීය ලේකම්වරු<br><br>සහකාර අධ්‍යක්ෂ, බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 9.3 | අලි කළමණාකරණ රක්ෂිතය තුළ පවතින කළුගල් කැණීමේ කර්මාන්තය සඳහා බලපත්‍ර ලබා ගැනීම | වනඅලි කළමණාකරණ ප්‍රදේශයේ පවත්වා ගෙන ගිය කළුගල් කැණීමේ බලපත්‍ර වාර්ෂිකව අළුත් කිරීම සිදු නොකිරීම නිසා මාර්ග සංවර්ධනය වැනි ව්‍යාපෘතිවලට කළුගල් හිඟ වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>කළුගල් සඳහා බලපත්‍ර ලබා ගැනීමට එකී භූමියේ අනුමැතිය ලබා ගැනීමට විශේෂ ආයතනයක්(පාලන කළමණාකරණ කමිටුවක්) නීත්‍යානුකූලව ස්ථාපිත නොමැති බැවින් එවැනි ආයතනයකින් අනුමැතියක් ඉල්ලීම තේරුමක් නොමැති බවට ද කරුණු ඉදිරිපත් විය. | පැවති කළුගල් කැණීම් බලපත්‍ර පැවති ක්‍රියාවලිය අනුගමනය කරමින් අළුත් කිරීම් කිරීමටත් නව බලපත්‍ර ලබා දීමේ දි අනෙකුත් කොන්දේසි සම්පූර්ණ වී ඇත්නම් ඉදිරියේ දී ඇති වන කළමණාකරණ තීරණයන්ට යටත්ව ලබා දීමට සුදුසු බවටත් තීරණය විය. | කැණීම් ඉංජිනේරු, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය<br>විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| **10.** | **අධ්‍යාපන ක්ෂේත්‍රය** | | | |
| 10.1 | කලාපීය සම්පත් පරිසණක මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා හම්බන්තොට ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි දැනට භාවිතයට නොගන්නා පරිගණක විද්‍යාගාර සහිත ගොඩනැගිල්ල ලබා ගැනීම | කලාපීය සම්පත් පරිගණක මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති බවත් හම්බන්තොට ප්‍රාථමික විද්‍යාලයේ පන්ති කාමරයක දැනට තාවකාලිකව පවත්වා ගෙන යන බවත් දැනුම් දෙන ලදී.<br>හම්බන්තොට ප්‍රාදේශීය සභා භූමියේ පිහිටි ගොඩනැගිල්ල පුස්තකාලය පවත්වාගෙන යාම සඳහාත් ග්‍රාම නිලධාරී,සංවර්ධන නිලධාරී,සමෘද්ධි සංවර්ධන නිලධාරී කාර්යාල පවත්වාගෙන යාමටත් භාවිතා කරන බැවින් ලබා දිය නොහැකි බව දැනුම් දෙන ලදී.<br>බදගිරිය වක්ආර හංදියේ පිහිටි ගොඩනැගිල්ල ලබා දිය හැකි බවද දැනුම් දෙන ලදී.<br>දුරස්ථ අධ්‍යාපන කටයුතු කරගෙන යාමේ දී මෙය කේන්ද්‍රස්ථානය වන බැවින් කලාප කාර්යාලය ආසන්නයෙන් ඉඩම් කොටසක් හෝ ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලීම් කරන ලදී. | මානප්ජාව ග්‍රාම නිලධාරී වසමේ වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටි ඉඩමෙන් කොටසක් මේ සඳහා ලබා දීමට ඇති හැකියාව සොයා බලා ඒ පිළිබඳව කටයුතු කිරීමට දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්, හම්බන්තොට<br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 10.2 | බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හ/රඹුක්කැටිය කණිටු විදුහලේ නව පාසල් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා ඉඩමක් රජයේ තක්සේරු මුදලට ලබා ගැනීම | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව තුළද මෙම යෝජනාව සාකච්ඡා වූ බව දැනුම් දෙන ලදී.<br>පෞද්ගලික ඉඩමක් රජයේ වන්දියක් යටතේ පුද්ගලයෙක් ලබා දීමට එකඟ වී ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>ක්‍රීඩා පිටිය ඉදි කිරීම සහ ගොඩනැගිලි ඉදි කිරීම යන යෝජනා 02ම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට යොමු කර ඇති බව දැනුම් දෙන ලදී. | දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විමසීමට තීරණය විය. | බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම්<br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ |
| 10.3 | තංගල්ල අධ්‍යාපන කලාපයේ මැදමුලන හ/අත්තනයාල මහවිද්‍යාලයේ පරිගණක ඒකකය අකර්මණ්‍යාව ඇති බැවින් එම ඒකකය යළි ස්ථාපනය කිරිම සඳහා ඉල්ලීම | 2006 වර්ෂයේ දී පරිසණක 10ක් ලබා දී ඇති නමුත් මෘදුකාංග යාවත්කාලීන කිරීම සිදුකර නොමැති බවත් එම පරිගණක දැනට අභාවයට ගොස් ඇති බවත් දැනුම් දෙන ලදී. | පළාත් සභාව මගින් පරිගණක 05ක් ලබා දීමට කටයුතු කරන බව දැනුම් දුන් අතර ඒ අනුව පරිගණක ඒකකය යළි ආරම්භ කරන ලෙස දැනුම් දෙන ලදී. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, තංගල්ල |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 11. | නිවාස ගැටළු | | | |
| 11.1 | හම්බන්තොට මයුරපුර සංස්ථා නිවාස සහ රොටරි නිවාසවල පදිංචිකරුවන් සඳහා දීර්ඝකාලීන බදු පදනම මත සහනදායී ක්‍රමයකට හිමිකම් ඔප්පු ලබා දීම | මෙම ඉඩම් 1987 වැනි කාල සීමාවක දී රජයේ සේවකයන්ට ලබා දෙන ලද ඉඩම් බවත් පවුල් 521ක් සඳහා ඉඩම් කැබලි වෙන් කර ඉන් 511ක් පදිංචිය සඳහා ලබා දී ඇති බවත් බොහෝ දෙනෙක් මෙම ඉඩම් කැබලි අන්සතු කර ඇති බවටත් කරුණු ඉදිරිපත් විය.<br>1989 වර්ෂය පදනම් වර්ෂය සේ සලකා ඉඩම් කැබලි 142ක් සඳහා නිදහස් දීමනා පත්‍ර ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බවත් ඔවුන්ගේ සම්පූර්ණ බදු මුදල රු.44,000.00ක් පමණක් වන බව දැනුම් දෙන ලදී.<br>ඉඩම් කැබලි 193ක් අන්සතු කරන ලද ඉඩම් කැබලි වන බැවින් 1989 වර්ෂය පදනම් වර්ෂය වශයෙන් ගතනොහැකි බැවින් 2019 වර්ෂය පදනම් වර්ෂය ලෙස ගෙන තක්සේරු කර ඇති අතර වටිනාකම රු.ලක්ෂ 34ක් පමණ වන බව දැනුම් දෙන ලදී.<br>මෙම පදිංචිකරුවන් සඳහා පැරණි ඉඩම් භුක්තිය පිළිබඳ තොරතුරු අනුව යම් සහනයක් ලබා දෙන ලෙස පළාත් ඉඩම් කොමසාරිස් මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව දැනුම් දෙන ලදී. | මෙම ප්‍රදේශවල පමණක් නොව බොහෝ ස්ථානවල මෙම ගැටළු තිබෙන බැවින් පදිංචිකරුවන්ට සාධාරණයක් ඉටුවන පරිදි කටයුතු කරන ලෙස ඉඩම් අමාත්‍යාංශ ලේකම්ට දැන්වීමට තීරණය විය. | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)<br>ප්‍රාදේශීය ලේකම්, හම්බන්තොට |
| 11.2 | ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අලිවැට අසල පිහිටා ඇති ගම්මාන 02ක් පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කිරීම | 2018 වර්ෂයේ ඉන්දියානු ආධාර වැඩසටහන යටතේ මෙම ව්‍යාපෘති 02 ආරම්භ කර ඇති බවත් පළමු අදියර යටතේ නිවාස 48ක් සඳහා පළමු වාරික මුදල් නිදහස් කර ඇති බවටත් කරුණු ඉදිරිපත් විය.<br>මෙම ගම්මාන 02 වන අලි කළමණාකරණ රක්ෂිතය තුළ පිහිටා ඇති බැවින් අලි වැටෙහි මායිම වෙනස් කිරීමට වනජීවී දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව එකඟතාවය ලැබී ඇති බවත් ප්‍රතිලාභීන්ගේ ශ්‍රම දායකත්වය මත එම කටයුත්ත සිදු කිරීමට රු.73,000.00ක ඇස්තමේන්තුවක් සකස් කර ඇති බවත් දන්වන ලදී.<br>නිවාස අමාත්‍යාංශය සමග ඉන්දියානු රජය සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඉතිරි ආධාර මුදල් ද නිදහස් කිරීමට එකඟතාවය පල කර ඇති බවත් වැඩිදුරටත් දැනුම් දෙන ලදී. | ප්‍රතිලාභීන්ගේ සුදුසුකම් පරීක්ෂා කර වාර්තාවක් දුන් පසු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දෙන තෙක් ආවරණ අනුමැතිය ලබා දීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම්, ලුණුගම්වෙහෙර<br><br>දිස්ත්‍රික් කළමණාකරු, නිවාස සංවර්ධන අධිකාරිය |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 12. | විදුලිබල ක්ෂේත්‍රය | | | |
| 12.1 | පළාත් ගබඩාව සඳහා තංගල්ල නගර සීමාව තුළ බර වාහන ප්‍රවේශ මාර්ගයක් සහිත සුදුසු ඉඩමක් ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කිරීම | දැනට හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාල භාණ්ඩ ගාල්ල ගබඩාව තුළ ගබඩා කිරීම ගැටළුකාරි වන බැවින් සහ පළාත් කාර්යාලය තංගල්ල ප්‍රදේශයේ පිහිටා ඇති බැවින් තංගල්ල ප්‍රදේශයෙන් මේ සඳහා සුදුසු ඉඩම් කොටසක් ලබා දෙන ලෙස ඉල්ලීම් ඉදිරිපත් විය.<br>තංගල්ල නගර සීමාවෙන් මේ සඳහා සුදුසු ඉඩම් කොටසක් සොයා ගැනීම අසීරු බවත් හම්බන්තොට ප්‍රදේශයෙන් පළාත් ගබඩාව සඳහා මෙන්ම පළාත් කාර්යාලය ඉදි කිරීම සඳහා ද සුදුසු ඉඩම් කොටසක් ලබා දිය හැකි බවත් දැනුම් දෙන ලදී. | හම්බන්තොට නගරය ආශ්‍රිතව අදාල ඉදිකිරීම් සිදු කිරීමට සුදුසු ඉඩම් කොටසක් ලබා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය. | ප්‍රාදේශීය ලේකම්, හම්බන්තොට<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, ලංකා විදුලිබල මණ්ඩලය, හම්බන්තොට<br>නේවාසික ව්‍යාපාර කළමණාකරු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 13. | ඌරු කොටුවක් පවත්වාගෙන යාම හේතුවෙන් ඇති වී තිබෙන මහජන පීඩා | ජීවවායු ඒකකයේ සිට වලකට කපන ලද කාණුව සහ එම වල නිරාවරණය වී පවතින බැවින් වර්ෂාව සහිත දිනවලදී එම වල සහ කාණුව පිටාර ගොස් යාබද නිවසට වතුර ගලාගෙන යන බව නිරික්ෂණය වූ අතර එම ගැටළු විසඳා ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇති බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කර ඒ අනුව ඉදිරි තීරණ ගන්නා ලෙස දැනුම් දෙන ලදී. | ගරු සභාපති, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව<br>ප්‍රාදේශීය ලේකම්, බෙලිඅත්ත<br>සහකාර අධ්‍යක්ෂ මධ්‍යම පරිසර අධිකාරිය |

මහජන ශුභසිද්ධිය පිණිස කටයුතු කිරීම දේශපාලන අධිකාරියේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම වන බැවින් දෙපාර්ශවයම න්‍යායශීලීව කටයුතු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලද අතර මෙම රැස්වීමේ දී ගනු ලැබූ තීරණ සම්බන්ධ ප්‍රගතිය ඉදිරිපත් කරන ලෙසද දැන්වීමෙන් අනතුරුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් කමිටුවේ සියළුම සාමාජිකයන් වෙත ස්තුතිය පලකරමින් ප.ව 2.00ට පමණ රැස්වීමේ කටයුතු අවසන් විය.

එච්.පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

එච්.පී.සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

2021 ජූලි මස ...24...... දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.